# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 3 ශ්‍රේණිය - පරිසරය (සැප්තැම්බර්-3 සතිය)


## 12 තේමාව - මිනිස් හැසිරීම්

**දුවේ පුතේ මෙන්න ඔයාලට මේ සතියේ කරන්න හොඳ පැවරුමක්.**


**මෙයට පාට කඩදාසි ඕනෑ වුණාට ගෙදර තියෙන ඕනෑම කඩදාසියක් ගන්න. (පරණ කැලැන්ඩරයක්).**

- වැඩිහිටියෙකුගේ උදවු ලබාගන්න.
    1. විශ්කම්භය සෙ.මී. 7ක් පමණ වන රවුම් හැඩ 6-7 ක් කපා ගන්න.

1 රූපය



2 රූපය



2. දෙවන රූපයේ පෙනෙන පරිදි කපා ගන්න. (කපාගත් රවුම් 7 ම)
3. සෙ.මී. 15ක් පමණ දිග සෙ.මී. 4ක් පළල බ්‍රිස්ටල් බෝඩ් කැබැල්ලක් කිහිපවරක් දිගට නමා නමුවක් සකස් කරගන්න.
4. කපාගත් රවුම් එකක් මැදට ගම් ගා සකස් කරගත් මල් නටුවේ කෙලවරට අලවා ගන්න.
5. නැවත තවත් රවුමක් ගෙන එම මල මැදින් අලවන්න.
6. දූන් ඉතුරු රවුම් ද මල්පෙති මැදින් අලවන්න.
7. මල්පෙති සියල්ල අලවා අවසන් වූ පසු විශ්කම්භය සෙ.මී. 2ක් වන කුඩා රවුමක් මල් මැද අලවන්න.
8. එක් එක් රවුමේ කපා ඇති පෙති කොටස් උඩ අතට නමා මල් පෙති ආකාරයට සකස් කර ගන්න.
9. නිර්මාණය ලස්සන කර ගන්න. නටුවට කොළ, කැකුළු එකතු කරගන්න.
10. මෙය ඔබේ නිවසේ වැඩිහිටියෙකුට පරිත්‍යාග කරන්න.

- පාසල් යන දවසට ගුරුතුමීට දෙන්න තව මලක් හදාගන්න.